පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.26 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2109/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. ගංජා හේන් වැටලීමක් - බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් සහ දියතලාව යුධ හමුදා කඳවුරේ නිළධාරින් කණ්ඩායමක් ඒකාබද්ධව හල්දුම්මුල්ල පොලිස් වසමේ ඉළුක්තැන්න රක්ෂිත ප්‍රදේශයේදී දින 02 ක් පුරා සිදු කළ මෙහෙයුමකදී,

- අක්කර 2 ½ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 36240 කින් පමණ යුත් ගංජා හේනක්
- අක්කර 2 ½ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 32850 කින් පමණ යුත් ගංජා හේනක්
- අක්කර 02 ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 28220 කින් පමණ යුත් ගංජා හේනක්
- අක්කර 01 ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 22140 කින් පමණ යුත් ගංජා හේනක්
- අක්කර ½ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 12770 කින් පමණ යුත් ගංජා හේනක්
- අක්කර ¼ ක පමණ ප්‍රදේශයක වගා කර තිබූ ගංජා පැළ 8520 කින් පමණ යුත් ගංජා හේනක්
- වියළි ගංජා කිලෝ 115 ක්

වැටලීම් කර ඇත. නඩු භාණ්ඩ ලෙස ගංජා හේන්වලින් ගංජා සාම්පල ලබා ගැනීමෙන් පසු ගංජා හේන් ගිනිතබා විනාශ කර ඇත. වැටලීම් සිදුවන අවස්ථාවේ සැකකරුවන් පලාගොස් ඇති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - මිල්ලනිය පොලිස් වසම.

2025.11.25 වන දින දහවල් කාලයේ මිල්ලනිය පොලිස් වසමේ මිල්ලනිය කැනන්තුඩාව මාර්ගයේ රන්මිණික වංගුවේදී පරගස්තොට දෙසට පෙර පාසල් ළමුන් ප්‍රවාහනය කරමින් තිබූ ත්‍රීරෝද රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයක් පසුකර ඉදිරියට ධාවනය කරන අවස්ථාවේ ත්‍රීරෝද රථයේ සිටි ගැහැණු දරුවෙකු හිස ත්‍රී රෝද රථයෙන් පිටතට දමා ඇති අතර, එහිදී ටිපර් රථයේ

දරුවාගේ හිස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ දරුවා හොරණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 04 ක් වූ මිල්ලනිය ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ත්‍රී රෝද රථයේ සහ ලොරි රථයේ රියදුරන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත. මිල්ලනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - ගිරාඳුරුකෝට්ටේ පොලිස් වසම.

2025.11.25 වන දින සවස් කාලයේ ගිරාඳුරුකෝට්ටේ පොලිස් වසමේ බෙලගන්වැව හෙබරව මාර්ගයේ කිලෝමීටර් 03 කණුව ආසන්නයේදී හෙබරව දෙස සිට බෙලගන්නැව දෙසට ධාවනය වෙමින් තිබූ ත්‍රී රෝද රථයක් ඉස්සර කිරීමට උත්සාහ කළ යතුරු පැදියක් මාර්ගයේ ලිස්සා ගොස් පෙරළී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි බස් රථයකට පැදිකරු යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ගිරාඳුරුකෝට්ටේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ බෙලගන්වැව, ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහිංගණය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ගිරාඳුරුකෝට්ටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මොරගහහේන පොලිස් වසම.

2025.11.25 වන දින උදෑසන කාලයේ මොරගහහේන පොලිස් වසමේ මොරගහහේන සිට හොරණ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් හොරගස් හන්දිය ආසන්නයේදී බස් රථයෙන් බැසගිය මහියෙකු බස් රථයට ඉදිරියෙන් මාර්ගය හරහා ගමන් කිරීමේදී එම බස් රථයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එම පුද්ගලයා හොරණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 පමණ වූ කනන්විල, හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - නවගමුව පොලිස් වසම.

2025.11.25 වන දින සවස් කාලයේ නවගමුව පොලිස් වසමේ කඩුවෙල අතුරුගිරිය මාර්ගයේ පහළ බෝමිරිය ප්‍රදේශයේදී අතුරුගිරිය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් පදික මාරුව මතින් මාර්ගය හරහා ගමන් කළ කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එම කාන්තාව නවගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 54 ක් වූ පහළ බෝමිරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නවගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**